3049

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: නර්තනය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම:-........................................................ විභාග අංකය:-................................................

**I කොටස**

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් හරි (✓) ලකුණ ද වැරදි නම් වැරදි ( X ) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

01. පා සරඹ/ මණ්ඩිපද ලය ප්‍රභේද අනුව නටනු ලබයි ( )

02. මාත්‍රා 2 + 3 තාලයට අයත් මාත්‍රා ගණන පහකි. ( )

03. නම්‍යතා අභ්‍යාසවල නිරත වීමෙන් මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි නිරෝගිමත් පුද්ගලයකුවීමේ භාග්‍ය උදාකරගත හැකි ය. ( )

04. ආධුනික ශිල්පියාගේ ජන්ම පත්‍රය බලා සුදුසු හෝරාවකට කළ එළි බැසීමේ චාරිත්‍රය සිදු කරනු ලබයි. ( )

05. රන් තෙළඹුවේ හා රත්න වල්ලියේ කවි සමඟ තාලම් කවිද යොදා ගෙන කුළු නැටුම් නටනු ලැබේ. ( )

- තීරු ගැළපෙන සේ යා කරන්න.

| | |
|---|---|
| 06. ගස්වැල් ඇඹරීම | උඩරට නර්තන ශිල්පියෙකි. |
| 07. ජේ.ඊ. සේදරමන් | කතරගම පෙරහැර |
| 08. ඉල්මහ මංගල්‍ය | කරගම් |
| 09. මාරි අම්මාන් | සබරගමු නර්තන ශිල්පියෙකි. |
| 10. රද්දැල්ලේ පොඩි මහත්තයා | ස්ථිතික චලනයකි. |

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. දෙවියන් වෙනුවෙන් දැඩි භක්තිය ප්‍රකාශ කිරීම සඳහා බිම පෙරළීම, ගිනි පෑගීම ආදී දුෂ්කර කාර්යන්හි නියලෙනු දැකිය හැකි වන්නේ,
    1. දෙවොල් මඩුවේදී ය.
    2. කතරගම පෙරහැරේදී ය.
    3. "කරගම්" නර්තනයේදී ය.
    4. කොහොඹා කංකාරියේදී ය.

12. මර්සලින් ජයකොඩි පියතුමා විසින් පද රචනය කළ ගීතයකි.
    1. අද වෙස්සන්තර රාජ පුතා......
    2. පාන්දරින් ඉස්කෝලෙට.....
    3. වෙසක් කැකුළු අතු අග ඉද.....
    4. ඇහැළ මලින් ගස් පිරිලා....

13. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
    1. පත්තිනි දේවිය පුද ලබන්නේ පහන් මඩුවේ පමණි.
    2. කොහොඹා දෙවි තුන් කට්ටුව පුද ලබන්නේ කොහොඹා කංකාරියේ ය.
    3. සේරමාන් රජුට ඇති වූ හිසරදය සුව කිරීම අතීත කතාවෙහි දක්වෙන්නේ දෙවොල් මඩුවේ පමණි.
    4. නර්තන සම්ප්‍රදායන් හා බැඳි සාරධර්ම සමග කළඑළි මංගල්‍ය නොගැළපේ.

14. විකල්ප වාද්‍ය භාණ්ඩ පමණක් දක්නට ලැබෙන වරණයකි.
    1. ගැටබෙරය, හොරණෑව හා රබාන
    2. පන්තේරුව, දවුල හා යක්බෙරය
    3. එක්ස්රේ රබාන, ටින් බෙරය හා ගස්ලබු බටනලාව
    4. ගැටබෙරය, දවුල හා දෙවොල් බෙරය

15. වන්නමක ප්‍රස්තුතය යනු
    1. තේමාවයි.
    2. බෙර පදයයි.
    3. තාලයයි.
    4. සංකීර්ණ බවයි.

- **හිස්තැන් පුරවන්න.**

16. අද වෙස්සන්තර රාජපුතා ගීතය අසන්නට ලැබෙන්නේ .............................. නාට්‍යයේ ය.

17. පහත රට සිංදු වන්නම් ගණනින් ........................................... කි.

18. එම්. එච්. ගෝමිස් මහතා ........................................ නර්තන ශිල්පියෙකි.

19. .............................. හි පිබිදීම ගමට අසුභ සංකේතයක් බව ගැමි ජන සමාජයේ විශ්වාසයයි.

20. සිංහල, හින්දු, මුස්ලිම් ආදිවාසීන් ආදී සියලු ජනයාගේ ආගමික පෙරහැරකි ..................................

(ලකුණු 2 x 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. (i) "උත්සාහ" භාවයෙන් නිරූපණය වන්නේ ............................ රසයි.

(ii) ............................... ප්‍රාන්තය කරගම් නර්තනයේ ආරම්භය ලෙස සැලැකේ.

(iii) 1 ............................... 2 ........................................... යනු සැරසිලි අංග නිර්මාණය සඳහා පරිසරයෙන් ලබා ගන්නා අමුද්‍රව්‍ය කිහිපයකි.

(iv) වැසි දිනක දකින්නට ලැබෙන ලක්ෂණ දෙකකි. 1..................................... සහ 2 ..............................

(v) සබරගමු නර්තන සම්ප්‍රදායයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වන්නේ ........................................... ය.

(vi) දවුල් ඇස සෑදීමට ගන්නා සම් වර්ග දෙක නම් ................................ සහ ........................................ ය.

(vii) ප්‍රධාන නර්තන සම්ප්‍රදායයන් හා බැඳි ශාන්ති කර්ම තුනෙහිම අසන්නට ලැබෙන ගායනා විශේෂයකි............

(viii) නෝම්බි ඇල්ලීම හෙවත් උපවාස ශීලය මාසයක් පුරා ආරක්ෂා කර අවසන් කරන දිනය................. උත්සව දිනයයි.

(ix) උඩරට නැටුම් කලාව ග්‍රන්ථය රචනා කරන ලද්දේ ................................ මහතා විසිනි.

(x) "සඳවට තරුවැල් ඇවිදින්...." යන කවිය ...................................... නැටුමට අයත් ව. (ලකුණු 12)

02. (i) දෙතිතේ තාල ප්‍රභේද 2 ක් නම් කරන්න.

(ii) එම තාල ප්‍රභේද සඳහා බෙර පදයක් බැගින් ප්‍රස්තාර කරන්න.

(iii) කුළු කවියක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 12)

03. (i) පුරාණයේ දවුල වාදනය කර ඇති වාදන අවස්ථා 3 ක් ලියන්න.

(ii) දවුල් බෙරයෙහි රූප සටහනක් අඳින්න.

(iii) තේමාවක් ලෙස "පෙරහැර" යොදාගෙන වාදනයක් නිර්මාණය කිරීමේ දී ඔබ විසින් අනුගමනය කරන පියවර 5 ක් ලියන්න. (ලකුණු 12)

04. (i) ඔබ කැමති වන්නමක්/ සිංදු වන්නමක් නම් කර එහි ප්‍රස්තුතයෙන් වර්ණනා වන්නේ කුමක්ද යි දක්වන්න.

(ii) එම වන්නමේ සිංදු වන්නමේ කවියක් ලියන්න.

(iii) එහි කස්තිරම/ ඉරට්ටිය/ කලාසම ලියා දක්වන්න. (ලකුණු 12)

05. (i) උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් තුළ කළ එළි බැසීමේ අවස්ථා නාමිකව හඳුන්වන්නේ කෙසේ ද?

(ii) එම සම්ප්‍රදායයන් තුනට අයත් වාද්‍ය භාණ්ඩ නම් කරන්න.

(iii) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදාය හා බැඳි කළඑළි බැසීමේ අවස්ථාව විස්තර කරන්න.

(ලකුණු 12)

06. (i) ශාන්ති කර්මයක් යනු කුමක්ද යි හඳුන්වා චාරිත්‍ර විධි 2 ක් නම් කරන්න.

(ii) ඔබ ඉගෙන ගන්නා නර්තන සම්ප්‍රදායයට අයත් ප්‍රධාන ශාන්ති කර්මය නම් කර එය පැවැත්වීමේ වර්තමාන හේතු 3 ක් ලියන්න.

(iii) ඒ හා බැඳි පුරාවෘත්ත කතාව ලියන්න. (ලකුණු 12)

07. "කරගම්" වෙනත් සංස්කෘතීන්ට අයත් ඉන්දියාවේ ගැමි නැටුම් අතරින් සුවිශේෂී නර්තනයකි.

(i) කරගම් නර්තනයෙහි පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම් කරන්න.

(ii) උත්සව පවත්වන කාල සීමාව කුමක් ද?

(iii) කරගම් නැටුමෙහි සුවිශේෂී ලක්ෂණ 4 ක් ලියන්න.

(iv) එම නර්තනයේ රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 12)